සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 8 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 21 S |
|---|---|---|

**සිංහල භාෂාව හා සාහිත්‍යය - I කොටස** — කාලය පැය දෙකයි

නම ...............................................

උපදෙස් :
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

★ අංක 01 හා 02 ප්‍රශ්නවල ඉරි ඇඳි පදයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) පිටරට ගිය පියා පැමිණෙන තුරු නයනා ඇඟිලි ගනිමින් සිටියා ය.
i. ඇඟිල්ලක් අල්ලාගෙන සිටියා
ii. සතුටින් හා අපේක්ෂාවෙන් සිටියා
iii. අතේ ඇඟිලි ගණන් කරමින් සිටියා
iv. දැඩි අකමැත්තකින් සිටියා

(02) සිරිමල් මෙවර විභාගයෙන් උසස් ලෙස සමත් වූ බව දැනගත් පසු ඔහුගේ හිසේ මලක් පිපුණි.
i. දැඩි කනස්සල්ලට පත් විය.
ii. ඔළුවේ මලක් පිපී ඇත.
iii. දැඩි සතුටට පත් විය.
iv. මලක් කඩා ඔළුවේ ගසා ගත්තේය.

(03) වැරදි අක්ෂර වින්‍යාසය සහිත පදයක් අඩංගු පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.
i. ආභරණ, ඡන්දය, නිෂ්පාදන, අක්ෂිදාන
ii. ලක්ෂණය, නිශ්ශබ්ද, කළමනාකරණය, දියුණු
iii. දූෂණ, පරිඝණකය, ඇත් රැළ, රෝපණය
iv. කාණ්ඩය, ප්‍රතිඵල, නවීකරණය, පුෂ්පය

(04) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පමණක් ඇතුළත් පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.
i. දුෂ්කර, පාර්ශ්වය, මධ්‍යස්ථානය, ආඛ්‍යාතය
ii. ගෝෂාව, නිෂ්චිත, ගණකාධිකාරී, සමස්ත
iii. අක්ෂර, විරුද්ධ, තීක්ශණ, පුනරීක්ෂණ
iv. ආශිර්වාද, මහාප්‍රාණ, සාම්ප්‍රධායික, විශේෂණ

(05) අකාරාදී පිළිවෙළ වැරදි ලෙස යෙදී ඇති පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.
i. කපුටා, කබරයා, කැරපොත්තා, කොවුලා
ii. කහ, දම්, නිල්, රතු
iii. පතෝල, පපඩම්, පරිප්පු, පලු
iv. වවුලා, වස්සා, වඳුරා, වේයා

(06) අකාරාදී පිළිවෙළ නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.
i. කමල්, අමල්, නිමල්, රමල්
ii. ඉෂාර, පමුදු, මයුර, සහන්
iii. නදීකා, නයනා, නිමාලි, නදිනි
iv. කළුතර, කුරුණෑගල, කෑගල්ල, කඳාන

(07) පහත සඳහන් වචන අතුරින් මහාප්‍රාණ අක්ෂරයක් නොයෙදුණු වචනය යටින් ඉරක් අඳින්න.
i. අර්ථය ii. ආභරණ iii. ලඹය iv. ධර්මය

(08) සඤ්ඤක අක්ෂරයක් නොයෙදුණ පදයක් සහිත පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.
i. හොඬ, හඳ, අඹ ii. ගඟ, දද, වඳ iii. හොඳ, සඳ, ගඟ iv. පඬෙරු, පඹයා, කඳාන

(09) විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ආශිර්වාද ක්‍රියා පිළිවෙළින් යෙදී ඇති පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
i. ලබන්න, ලබමින්, ලැබේවා
ii. නටමින්, නටන්න, නැවේවා
iii. පිපේවා, පිපෙන්න, පිපෙමින්
iv. ඉතිරෙන්න, ඉතිරේවා, ඉතිරෙමින්

(10) "අල්ලපු අත්තත් නෑ, පය ගහපු අත්තත් නෑ" යන සාම්ප්‍රදායික යෙදුම කවර වර්ගයකට අයත් දැයි තෝරා යටින් ඉරක් අඳින්න.
i. ඉඟි වැකියකි. ii. ආප්තෝපදේශයකි. iii. යුගල පදයකි. iv. ප්‍රස්තාව පිරුළකි.

(11) පහත වචනවල අර්ථය හිස්තැන්වල ලියන්න.

i. පුරාණෝක්ති ............................................. ii. ජන්මෝත්සවය ..........................................

(12) පහත සඳහන් වචන වලට සමානාර්ථ පදය බැගින් හිස්තැන් තුළ ලියන්න.

i. අක්ෂි ............................................. ii. දිළිඳු ..........................................

(13) පහත සඳහන් වචනවල විරුද්ධාර්ථ පදය හිස්තැන්වල ලියන්න.

i. කීකරු ............................................. ii. වියදම ..........................................

(14) පහත සඳහන් කවියෙහි ඇතුළත් උපමාවක් හා උපමේයක් වෙන් කොට ලියා දක්වන්න.

මගෙ නංගිගෙ පොඩි හිනාව
වගේය මේ පිච්ච පොකුර
ඇගෙ කම්මුල් දෙකේ පාට
කොයින්ද මේ රෝස මලට

i. උපමාව ............................................. ii. උපමේය ..........................................

(15) පහත සඳහන් වාක්‍යවල හිස්තැනට ගැළපෙන නිවැරදි පදය වරහන් තුළින් තෝරා ලියන්න.

i. දර කපමින් සිටි සිරියලතා .............................. (කඳ / කද) මත හිඳගෙන ගිමන් හැරියාය.

ii. අම්මා අඳුර වැටෙන්නට පෙර නිවසේ ............................ (පහණ / පහන) පත්තු කළාය.

(16) පහත සඳහන් පදවල අනුක්ත පද හිස්තැනෙහි ලියන්න.

i. ළමයි .................................. ii. ගොවියෙක් .......................................

(17) 'අක්කා දෙමාපියන් නැමැද පාසල වෙත <u>සෙමෙන්</u> පිය නැඟුවාය'.
ඉහත සඳහන් වාක්‍යයෙහි ඉරි ඇඳි පදය අයත් ව්‍යාකරණ වර්ගය තෝරා යටින් ඉරක් අඳින්න.

i. පූර්ව ක්‍රියා පදයකි. ii. ක්‍රියා විශේෂණ පදයකි.
iii. නාම විශේෂණ පදයකි. iv. මිශ්‍ර ක්‍රියා පදයකි.

(18) පහත සඳහන් වාක්‍ය සඳහා සුදුසු අතීත කාල ක්‍රියා පද හිස්තැන්වල යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. ක්‍රීඩකයෝ ක්‍රීඩා පිටියට ......................................................

ii. කුරුල්ලා අහසේ පියාසර ...............................................

(19) පහත සඳහන් යුගල පද සඳහා, සුදුසු පද යොදා සම්පූර්ණ කරන්න.

i. රැවුම් ............................ ii. මුදල් ....................................

(20) පහත සඳහන් කවි පද දෙකෙන්, දී ඇති පද දෙකට සමාන අර්ථ දෙන පදය බැගින් තෝරා ලියන්න.

පතසන් අවරගිර නැටියෙන් වැටෙන කල
විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඩල

i. හොඳින් ඉදුණු .................................................... ii. බස්නාහිර ..........................................

(ලකුණු 2x20 = 40 යි).

## II කොටස

**ප්‍රශ්න අංක (1), (2) හා (3) ඇතුළත්ව, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(1) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) රබීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ නොබෙල් ත්‍යාගයක් ලැබූ ප්‍රකට කෘතිය කුමක් ද?

(ii) එතුමා කවර ජාතිකයෙක් ද?

(iii) පහත සඳහන් වැකියෙහි පද දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම පද දෙක නිදොස් කොට ලියන්න.

"සොර මුල ඇත් රළ දැක බියෙන් පළා ගියහ."

(iv) "ඉඳුල් බතක් සෙම් සොටු හා කෙළත් ලා
අනා බිදීමෙන් කිසිවෙක් රකිත් දිවි"

ඉහත පද්‍ය දෙපදයේ සඳහන් "බිදීමෙන්" හා "දිවි" යන්නෙහි අදහස ලියන්න.

(v) පහත සඳහන් කවියෙහි ඉතිරි පද දෙක විරිතට අනුව සම්පූර්ණ කරන්න.

විහඟුන් සැරිසරයි
විල්වල නෙළුම් පිබිදෙයි
.............................. ..............
.............................. ..............

(ලකුණු 2×5=10)

(2) පහත සඳහන් මාතෘකා අතුරින් <u>එක්</u> මාතෘකාවක් තෝරා ගෙන වචන <u>150</u> ක් පමණ වන සේ රචනයක් ලියන්න.

(i) කියවීමේ පුරුද්ද ඉගෙනුමට අත්වැලකි.

(ii) ශ්‍රී ලංකාවේ සුන්දරත්වය සුරකිමු.

(iii) නීතිගරුක රියදුරෝ අපේ මිතුරෝ ය.

(iv) නීරෝගීමත් දිවියක් උදෙසා ආහාරවල වැදගත්කම

(v) අලුත් අවුරුද්දට සැරසෙමු. (ලකුණු 20)

(3) ඔබ පාසලේ ශිෂ්‍ය නායක මණ්ඩලයට නව ශිෂ්‍ය නායක නායිකාවන් බඳවා ගැනීම සඳහා සුදුසු ආකෘති පත්‍රයක් සකස් කර සම්පූර්ණ කරන්න. (ලකුණු 10)

(4) (i) මහාප්‍රාණ අක්ෂර යෙදුණු වචනයක් ඇතුළත් කරමින් නිවැරදි වාක්‍ය 05 ක් නිර්මාණය කරන්න. (ලකුණු 5)

(ii) අක්ෂර වින්‍යාසය නිවැරදි කර ලියන්න.

i. පරිඝනකය -
ii. කෘතිම -
iii. කනිශ්ට -
iv. ගිජ්ජකූටය -
v. ප්‍රතික්සේප - (ලකුණු 5)

(5) පහත සඳහන් පද්‍ය පන්තිය කියවා ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපන්න.

පිණි බිඳු මැකී යයි
මඳ සුළඟ හමා යයි
මේ කදිම උද යයි
කියන්නාසේ ඉර ද පා යයි

නැගෙනහිර අහ සේ
රන්කෙඳි අදින්නා සේ
ඉරුගෙ රැස් දිළි සේ
එයින් මුළු ලෝකය ම සැර සේ

සුදු-රතු ඇඳුම් ඇ ඳ
සිනාසෙන ළමයින් ලෙ ඳ
විහිදුවමින් සුව ඳ
නෙළුම් මල් පිබිදේය විල් මැ ඳ

(i) පද්‍ය පන්තියේ සඳහන් පරිදි පිණිබිඳු මැකීයාමට හේතුව කුමක් ද?
(ii) පද්‍ය පන්තියේ සඳහන් පරිදි මුළු ලොව සැරසෙන්නේ කුමකින් ද?
(iii) මෙහි නෙළුම් මල් සමාන කර ඇත්තේ කාහට ද?
(iv) පද්‍ය පංතියේ ඇතුළත් සඤ්ඤක අක්ෂර යෙදුණ වචන දෙකක් ලියා අක්ෂරයට යටින් ඉරක් අඳින්න.
(v) පහත සඳහන් පද සඳහා සමානාර්ථ පද පද්‍ය පන්තියෙන් තෝරා ලියන්න.
අ) සියපත - ආ) තුෂර - (ලකුණු 2×5 = 10)

(6) පහත සඳහන් අවස්ථා අතුරින් එක් අවස්ථාවක් තෝරාගෙන ඔබ කැමති පරිදි වචන 75-100 ක පමණ සංවාදයක් නිර්මාණය කරන්න.
(I) පන්සලේ ස්වාමීන් වහන්සේ හා දහම් පාසල් ශිෂ්‍යයෙකු අතර සංවාදයක්
(ii) ප්‍රතිකාර ගැනීමට ගිය රෝගියෙකු වෛද්‍යවරයෙක් සමඟ කතාබහ කරන අවස්ථාවක්
(iii) ගිණුමක් ආරම්භ කිරිමේදී බැංකු නිලධාරියෙකු සමඟ කතාබහ කරන අවස්ථාවක් (ලකුණු 10)

(7) පහත සඳහන් උධෘත පාඨ ඇසුරින් පහත දක්වා ඇති වගුව සම්පූර්ණ කරන්න.
(i) "උඹේ මේ කෙහෙල්මල් හවරිය හින්දා මගේ හේනේ කුඹුරේ වැඩත් පාළු වුණා."
(ii) "හෙට උදේ දහයයි විසිතුනට තමයි අලුත් අවුරුදු උදාව සිද්ධ වෙන්නේ"
(iii) "මොකද මේක ඉංග්‍රිසියෙන් ලියලා තියෙන්නේ? බැරිද ඉංග්‍රිසියෙන් ම කියන්න."
(iv) "හෙට හවස මාත් එක්ක කැකිරාවට යන්න ලෑස්තිවෙලා එන්න පුළුවන් ද?"
(v) "මේක කාටත් පොරෝජන වෙන දෙයක් හරි ද?"

| | පෙළපොතේ සඳහන් පාඩමේ නම | කීවේ කවුද ? | කීවේ කාහට ද? | කීවේ කුමන අවස්ථාවේදී ද? |
|---|---|---|---|---|
| i. | | | | |
| ii. | | | | |
| iii. | | | | |
| iv. | | | | |
| v. | | | | |

(ලකුණු 2×5= 10)

****

# පළමු වාර පරීක්ෂණය - 2019
## 8 ශ්‍රේණිය - සිංහල භාෂාව හා සාහිත්‍යය (පිළිතුරු පත්‍රය)
### I කොටස

(01) II (02) III (03) III (04) I (05) IV

(06) II (07) III (08) II (09) I (10) IV

(11) I. පැරණි කියමන්
II. උපන්දින උත්සවය

(12) I. ඇස, නයන, ........
II. දුප්පත්, දරිද්‍ර, ........

(13) I. අකීකරු
II. ආදායම

(14) I. උපමාව : පිච්ච පොකුරු
II. උපමේය : නංගිගේ පොඩි හිනාව

(15) I. කඳ II. පහන

(16) I. ළමයින් II. ගොවියකු

(17) II

(18) සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න

(19) I. ගෙරවුම්
II. කඳහදල්

(20) I. විලිකුන්
II. අවරගිර

### II කොටස

(01) I. ගීතාංජලී
ii. බෙංගාලි ජාතිකයෙක්
iii. මුළ / පලා
iv. කැමෙන් / ජීවිතය
v. සුදුසු පරිදි ලකුණු දෙන්න.

(02) අන්තර්ගත කරුණු, ස්වීයත්වය හා ශිල්පීය දක්ෂතා යනාදි කරුණු මත ලකුණු දෙන්න. (ලකුණු 10)

(03) අදාළ කරුණු අනුව ලකුණු දෙන්න. (ලකුණු 10)

(04) i. නිවැරදි වචන සඳහා ලකුණු ලබාදෙන්න
ii. I. පරිගණකය
ii. කෘත්‍රිම
iii. කනිෂ්ඨ
iv. ගිජ්ඣකූට
v. ප්‍රතික්ෂේප
(ලකුණු 10)

(05) i. දවස උදාවීම / ඉර උදාවීම / උදෑසන ආරම්භ වීම
ii. ඉරුගේ රැස්වලින් / ඉරුගේ රැස් දිළිසීමෙන්
iii. සුදු-රතු ඇඳුම් ඇඳගත් ළමයින්ට/ ළමයින්ට
iii. නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න
iv. අ) සියපත - නෙළුම ආ) තුෂර - පිණි
v. ප්‍රතික්ෂේප
(ලකුණු 10)

(06) සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න. (ලකුණු 10)

(07)

| | පෙළපොතේ සඳහන් පාඩමේ නම | කීවේ කවුද? | කීවේ කාහටද? | කීවේ කුමන අවස්ථාවේදීද |
|---|---|---|---|---|
| I. | එතනහාමි | ඩිංගිරාල | එතනහාමිට | සාස්තරකාරයා බොරු කී විට |
| ii. | අලුත් අවුරුදු උත්සවය | සීයා | මුණුබුරාට | අවුරුදු චාරිත්‍ර පිළිබඳ කතා කරන විට |
| iii. | කතාබහට අවධානය | අම්මා | ඒජන්ත උන්නාන්සේට | පෙත්සම පිළිගැන්වූ අවස්ථාවේ |
| iv. | කතාබහට අවධානය | ගුරුතුමා | මුදලිහාමිට | පාසලේදී |
| v. | එනතහාමි | සාස්තරකාරයා | එතනහාමිට | සාස්තර බලන අවස්ථාවේ |

(ලකුණු 2x5=10)